ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

**<u>පුවත්පත් නිවේදනය</u>**

ඉන්දීය විදේශ කටයුතු අමාත්‍යතුමා ඉන්දියා - ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සාමාජිකයන් ද්විපාර්ශ්වික සබඳතා පිළිබඳව දැනුවත් කරයි

ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ සහ ඉන්දියා - ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සාමාජිකයන් සහ විවිධ පක්ෂ නායකයන් අතර හමුවක් 2023 අගෝස්තු 23 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී පැවතිණ. කතානායක මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් කැඳවා තිබූ මෙම හමුව සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 50 දෙනෙකුට අධික පිරිසක් සහභාගි වූහ. ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මහතා වීඩියෝ පණිවිඩයක් හරහා එම හමුව ඇමතීය.

2. මෙම අවස්ථාව අමතමින් ගරු කතානායකතුමා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර දිගුකාලීන ද්විපාර්ශ්වික සබඳතා පවතින බව සඳහන් කළ අතර දෙරට ව්‍යවස්ථාදායක ආයතන අතර සංවාදය සහ සහයෝගීතාවය පෝෂණය කිරීමෙහි ලා වැදගත් වේදිකාවක් වශයෙන් ඉන්දියා - ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය විසින් ඉටු කරන භූමිකාව අවධාරණය කළේය. මෙම අවස්ථාවේදී අදහස් දක්වමින් මහ කොමසාරිස්තුමා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් මෑතකදී සිදු කරන ලද ඉන්දීය සංචාරය සිහිපත් කළ අතර දෙරටට ම ආර්ථික සමෘද්ධිය ගෙන ඒමෙහිලා සම්බන්ධකතාවය විසින් ඉටු කරන කේන්ද්‍රීය භූමිකාව අවධාරණය කළේය. මේ අතර හමුව ඇමතූ ඉන්දියා - ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ ලේකම් අනුර ප්‍රියදර්ශන යාපා මහතා ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට ලබා දෙන සහයෝගය අගය කළ අතර දෙරට අතර වඩා ශක්තිමත් පාර්ලිමේන්තු සබඳතා ඇති කර ගත යුතු බව සඳහන් කළේය.

3. විදේශ කටයුතු අමාත්‍යතුමා සිය වීඩියෝ පණිවිඩයේ දී දෙරට අතර භූගෝලීය ආසන්නතාවය සහ බෙදා හදා ගන්නා ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් මත ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවේ සංවර්ධනය, ස්ථාවරත්වය සහ සෞභාග්‍යය උදෙසා ලබා දී ඇති ධනාත්මක දායකත්වයන් පිළිබඳව අදහස් දැක්වීය. ශ්‍රී ලංකාව විසින් පසුගිය වසරේදී මුහුණ දෙන ලද ආර්ථික අභියෝගයන් හමුවේ ඉන්දියාව සිය "අසල්වැසියා ප්‍රථමයෙන්" යන

ප්‍රතිපත්තිය පිළිඹිබු කරමින් ශ්‍රී ලංකාවට කඩිනමින් සහ සැලකිය යුතු ලෙස ප්‍රතිචාර දැක්වූ බව එතුමා පෙන්වා දුන්නේය. ජාත්‍යන්තර ආයතන සහ ද්විපාර්ශ්වික සහකරුවන්ගේ ප්‍රතිචාරය ඉක්මවා යමින් ඉන්දියාව විසින් ලබා දුන් ඇමරිකානු ඩොලර් බිලියන 4ක් පමණ වන මූල්‍ය සහයෝගය ප්‍රමාණය සහ වේගවත් බව යන දෙයාකාරයෙන්ම පෙර නොවූ විරූ සහයෝගයක් බව එතුමා අවධාරණය කළේය.

4. විදේශ කටයුතු අමාත්‍යතුමා විදුලිබල ජාල සම්බන්ධතාවයක් සහ පෙට්‍රෝලියම්, තෙල් සහ ලිහිසි තෙල් නලයක් හරහා සහයෝගීව ශ්‍රී ලංකාවේ බලශක්ති අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා දිගු කාලීන සහ තිරසාර විසඳුම් සෙවීම උදෙසා ඉන්දියාවේ දැක්ම පැහැදිලි කළේය. එතුමා පුනර්ජනනීය බලශක්තිය සඳහා පවතින විභවතාවය සහ අන්‍යෝන්‍ය ප්‍රතිලාභය උදෙසා ත්‍රිකුණාමලය මධ්‍යස්ථානය ඇතුළු කලාපීය ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳව ද අවධාරණය කළේය.

5. දෙරට අතර සෞභාග්‍යමත් අනාගතයක් සඳහා සමුද්‍රීය, ගුවන්, බලශක්ති, වෙළෙඳ, අයෝජන සහ ඩිජිටල් සබඳතා වැනි විවිධ ක්ෂේත්‍රවල සම්බන්ධතාවය අතිශය වැදගත් බව විදේශ කටයුතු අමාත්‍යතුමා අවධාරණය කළේය. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ඉන්දීය සංචාරය පිළිබඳව සඳහන් කරමින් එතුමා ප්‍රකාශ කළේ දෙරට නායකයන් අතර පැවති සාකච්ඡා පොදු සහයෝගිතා දැක්ම පිළිඹිබු කරමින් වෙළෙඳ, ආයෝජන සහ ජනතාව අතර සම්බන්ධතාවය ඉහළ නැංවීමට වන කැපවීම ශක්තිමත් කළ බවයි.

6. කලාපීය ආරක්ෂාව පිළිබඳව සඳහන් කරමින් විදේශ කටයුතු අමාත්‍යතුමා ඉන්දියාවේ “කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය”(SAGAR) යන දැක්ම සහ කොළඹ ආරක්ෂක පර්ෂදය, ඉන්දියානු සාගර වට්දදර සංගමය (IORA) සහ BIMSTEC වැනි විවිධ සංවිධාන හරහා එය ප්‍රකාශ වී තිබෙන බව අවධාරණය කළේය.

7. විදේශ කටයුතු අමාත්‍යතුමා ශ්‍රී ලංකාවේ බහු වාර්ගික, බහු භාෂාමය සහ බහු ආගමික අනන්‍යතාවය සුරැකීම සඳහා ඉන්දියාවේ සහයෝගය ද අවධාරණය කළේය. එක්සත් සහ සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් තුළ සමානාත්මතාවය, යුක්තිය සහ ආත්ම ගරුත්වය උදෙසා දමිළ ජනතාවගේ අභිලාෂයන් ආමන්ත්‍රණය කරන සංහිඳියා ක්‍රියාදාමයක් අපේක්ෂා කරන බව ද එතුමා සඳහන් කළේය. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව බලය බෙදීමක් සහ පළාත් සභා මැතිවරණය කඩිනමින් පැවැත්වීම මෙම අරමුණ සඳහා උපකාරී වන බව එතුමා පෙන්වා දුන්නේය.

8. විදේශ කටයුතු අමාත්‍යතුමාගේ පණිවිඩය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින දිගුකාලීන මිත්‍රත්වය සම්බන්ධයෙන් සිහි කැඳවීමක් වූ අතර දෙරට සහ වඩා පුළුල් කලාපයේ

අන්‍යෝන්‍ය ප්‍රතිලාභය උදෙසා සබඳතා ශක්තිමත් කිරීම උදෙසා වන කැපවීමට නව ජවයක් ලබා දුන්නේය.

***

කොළඹ
2023 අගෝස්තු 23